**2019 ජනවාරි මාසය සඳහා අයැදීමට සහ**
**මැදිහත් වීමට අත්වැලක්**

**"පිබිදෙන්න... ඔබ අසා පිළිගත් වචනය සිහිකර ඊට කීකරු වී, පසුතැවී සිත හරවා ගන්න. ඔබ අවදි වී නොසිටින්නහු නම්, සොරෙකු මෙන් ඔබ වෙත එන්නෙමි. මා ඔබ වෙත පැමිණෙන වේලාව ඔබ නොදන්නහු ය.** (එළිදරව් 3:2-3)

වසරක් ගෙවී නව වසරක් උදා වී ඇත. එනම්, ජේසු ක්‍රිස්තුන් වහන්සේ මෙලොව ඉපදී මිනිස් සංහතියේ පාපයේ විපාකවලට වන්දි ගෙවීම සඳහා කුරුසියේ ශ්‍රී රුධිරය හෙලා මරණයට පත් වේ. මරණයෙන් උත්ථාන වී දැනට වසර 2018ක් සම්පූර්ණ වී ඇත.

ඔවුන් වහන්සේ විරාජමානව දෙවන වර පැමිණෙන තුරු ඔවුන් වහන්සේ අභිරහස්මක ලෙස අප අතර වැඩ සිටින සේක. එනම් අපගේ එකමුතුකම තුළ, දේව වචනයට සවන් දීමේදී , දිව්‍ය පූජා යාගය තුළදී සහ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ඔවුන් වහන්සේ බලගතුව ප්‍රකාශ වන සේක. එමෙන්ම විවිධ සිද්ධීන් හරහා අපට ඔවුන් වහන්සේ අත්දැකිය හැක. එසේ වන්නේ අප තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ට අවදි වන තරමට ය.

අයැදීමේ සේවකයන් වශයෙන් මෙම වසර පුරාත් පුබුදුව, දේශය, ශුද්ධවූ සභාව, ලෝකය වෙනුවෙන් සහ ශුද්ධිකාගිනිස්ථානයේ දුක් විඳින ආත්මයන් වෙනුවෙන් යාච්ඤා කරමු.

මහා පුබුදුවක් ලෙස 2022 ජුබිලි වර්ෂය සැමරීමට මේ කාලයේ පටන්ම අපි මනස්ස්ථාපනයෙන් සූදානම් වී සිටිමු. අද සුපුවතේ ප්‍රකාශ වන ලෙස, අප අසා පිළිගත් වචන සිහිකර මනස්ස්ථාපනය වී සිත් හරවා ගැනීමට නිතර ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහය පතමු. එමෙන්ම පුබුදු ජනතාව තුළ මේ සූදානමට ගැඹුරු ලෙස අවදි වීම සඳහා අඛණ්ඩව අයදිමු.

විශේෂයෙන් අප රට තුළ පවතින දේශපාලනික අර්බුදයන් නිසා පීඩා විඳින අප රටේ අසරණ ජනතාව ඉදිරියට ගෙන ගොස් රට ස්වයංපෝෂණය කරන අවංක නිහතමානි නායකයින් මතුකරන්න කියා අපි අඛණ්ඩව අයදිමු.

> **" එබැවින් යමෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම්,**
> **එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහව ගොස් ඇත.**
> **දැන් සියල්ල අළුත් වී තිබේ."** (2කොරෙන්ති 5:17)

පළමු සතිය - දිව්‍යමය කියවීම - එළිදරව් 3:1-5
අයැදීමට විශේෂ යොමුව :

ලැබුවාවූ වසර තුළ අප දේශය තුළ පවතින විෂමතා දුරින් දුරු කර, රට තුළ අවංක දේශපාලන නායකයින් බිහි වී, ධර්මයට මුල් තැන දෙන සමෘද්ධිමත් දේශයක් ඇති කරන මෙන් යාච්ඤා කරමු. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ස්වාමි තාත්තා වෙනුවෙන්.
* දිවැසි එකතුව, සහයක එකතුව, සුසමත එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පොදු දිනය සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

දෙවන සතිය - දිව්‍යමය කියවීම - ශු.මතෙව් 10:26-31
අයැදීමට විශේෂ යොමුව :

2019 වසර පුබුදු තරුණ වසර මෙන්ම කලා වසර යනුවෙන් නම් කර ඇති අතර, පුබුදු තරුණ-තරුණියන් සහ පුබුදු කලා සේවාව තුළින් නවෝදයක් ඇති වන පිණිස මොර ගසා අයදින්න.
(විනාඩි10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ජනවාරි 13 වන ඉරුදින සමිඳාණන්ගේ ස්නාපන මංගල්‍යය වෙනුවෙන් සාංඝිකවල සහ විවිධ මිසම්වල කෙරෙන යැදුම් මෙහෙයන් තුළ ශුද්ධාත්ම බලය ප්‍රකාශ වන පිණිස.
* 15 වන අඟහරුවාදා පිවිසීමේ කථා මාලාවන් දෙන වචනයේ සේවකයන් වෙනුවෙන් ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ඥානකාන්තියට සහභාගි වන වචනයේ සේවකයන් සහ ඔවුන්ට උදව් වන වචනයේ සේවකයන් වෙනුවෙන්.
* ජනවාරි 19-20 දිනවල සියළුම වගකීම් ගන්නා සේවකයන් සඳහා පැවැත්වෙන ත්‍රෛ මාසික කඳවුරට සහභාගි වන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

තෙවන සතිය - දිව්‍යමය කියවීම - රෝම 8:1-8
අයැදීමට විශේෂ යොමුව :

මත්පැන්, මත් ද්‍රව්‍ය ඇතුළු විවිධ අපචාරයන්ට යොමු වී ඇති තරුණ තරුණියන්, බාල දරුවන්, වැඩිහිටියන් වෙනුවෙන් සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ඔවුන්ට උදව් වන සියළු දෙනා වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* සුබැදි සංඝය වෙනුවෙන්
* විදේශ රටවල පුබුදු සංඝයන් සහ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* අයැදීම් එකතු නැති ප්‍රශංසාගම් සහ ශ්‍රාවක සංඝවල අයැදීම් එකතු ආරම්භ වන පිණිස.
* ජනවාරි 26-27 දිනවල ශ්‍රී ප්‍රශංසාරාමයේ පැවැත්වෙන විවාහ අපේක්ෂක සමුළුවට සහභාගි වන යුවල් සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

සතරවන සතිය - දිව්‍යමය කියවීම - ශු.මතෙව් 7:1-6
අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :
* ශුද්ධෝත්තම පියතුමා ඇතුළු රදගුරු, පූජක, පැවිදි, ගිහි ධර්මදූත සේවාවේ නියැලෙන සියළු දෙනා වෙනුවෙන්.
* ප්‍රුසේ වාස් මෙහෙයට සම්බන්ධ වී විවිධ ප්‍රදේශවල දූත කාර්යයේ යෙදෙන සියළු දෙනා වෙනුවෙන්.
* හෘද්‍යාබාධ, පිලිකා, වකුගඩු ආදි රෝගවලට භාජනය වී ඇති සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

අවධානය සඳහා :

* මාසයේ සෑම සිකුරාදාම යාච්ඤාවේ සහ උපවාසයේ දිනයන් ලෙස ගත කරන්න. නිරන්තර ශුද්ධාත්මයාණන්ට අවදිවීම, ජපමාලය උච්ඡාරණය කිරීම, දිව්‍ය පූජාව, මගේ පැය, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරිපිට පෙනී සිටීම. පෞද්ගලික කාලසටහනක් සකස් කරගෙන මෙම දිනය අර්ථවත් ලෙස නිශ්ශබ්දව ගත කරන්න.

* අයැදීම් එකතුව අවසන් කර නපුරාට අණ කිරීමේ යාච්ඤාවට ඇතුළු වන්න.

**ආලෝකමත් වසරක් වේවා !**

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

******************************